29. අඤ්ඤතත්ථං පසාදත්ථං සතං වෙ හොති මන්තනා,
එවං ඛො අරියා මන්තෙන්ති එසා අරියාන මන්තනා,
එතදඤ්ඤාය මෙධාවී න සමුස්සෙය්‍ය මන්තයෙති.

## 3. 2. 2. 8.

18. සචෙ භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: තයො, මෙ ආවුසො ධම්මා: කතමෙ තයො: රාගො දොසො මොහො. ඉමෙ ඛො ආවුසො තයො ධම්මා. ඉමෙසං ආවුසො තිණ්ණං ධම්මානං කො විසෙසො, කො අධිප්පායො, කිං නානාකරණන්ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං කින්ති බ්‍යාකරෙය්‍යාථාති?

භගවම්මූලකා නො භන්තෙ ධම්මා භගවන්නෙත්තිකා භගවම්පටිසරණා සාධු වත භන්තෙ භගවන්තඤ්ඤෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො: භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙන හි භික්ඛවෙ සුණාථ -පෙ- භගවා එතදවොච:

සචෙ භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං තයො, මෙ ආවුසො ධම්මා: කතමෙ තයො: රාගො දොසො මොහො. ඉමෙ ඛො ආවුසො තයො ධම්මා. ඉමෙසං ආවුසො තිණ්ණං ධම්මානං කො විසෙසො, කො අධිප්පායො, කිං නානාකරණන්ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරෙය්‍යාථ: රාගො ඛො ආවුසො අප්පසාවජ්ජො දන්ධවිරාගී, දොසො මහාසාවජ්ජො ඛිප්පවිරාගී, මොහො මහාසාවජ්ජො දන්ධවිරාගීති.

කො පනාවුසො හෙතු කො පච්චයො, යෙන අනුප්පන්නො වා රාගො උප්පජ්ජති, උප්පන්නො වා රාගො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති? සුභනිමිත්තන්තිස්ස වචනීයං.

තස්ස සුභනිමිත්තං අයොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව රාගො උප්පජ්ජති. උප්පන්නො ච රාගො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අයං ඛො ආවුසො හෙතු, අයං පච්චයො, යෙන අනුප්පන්නො වා රාගො උප්පජ්ජති, උප්පන්නො වා රාගො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

කො පනාවුසො හෙතු කො පච්චයො, යෙන අනුප්පන්නො වා දොසො උප්පජ්ජති, උප්පන්නො වා දොසො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති? පටිඝනිමිත්තන්තිස්ස වචනීයං.

තස්ස පටිඝනිමිත්තං අයොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව දොසො උප්පජ්ජති, උප්පන්නො ච දොසො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අයං ඛො ආවුසො හෙතු, අයං පච්චයො, යෙන අනුප්පන්නො වා දොසො උප්පජ්ජති, උප්පන්නො වා දොසො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

Free Distribution www.aathaapi.org

29. පණ්ඩිතයන්ගේ මනාප්‍රණාම දැහුම් පිණිස ද ප්‍රසාදය පිණිස ද එකැතින් වෙයි. ආර්‍යයෝ මෙසේ මනාප්‍රණය කෙරෙති, මේ ආර්‍යයන්ගේ මනාප්‍රණාම යි. ප්‍රශස්තබුද්ධි ඇති පණ්ඩිත තෙම මෙපවත් දූත මාත්‍රයෙන් හුවා නො ගන්නේ ය. මාත්‍රනිඃශ්‍රිත නො වී මනාප්‍රණය කරන්නේ ය.

3. 2. 2. 8.

18. මහණෙනි, ඉදින් අන්‍යතොටු පිරිවැජියෝ "ඇවැත්නි, මේ ධර්මයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: රාගය, ද්වෙෂය, මොහ යි ඇවැත්නි, මේ ධර්මයෝ තුන් දෙනයහ. ඇවැත්නි, මේ තුන් දහම්හුන්ගේ විශේෂය කවරේ ය, අභිප්‍රාය කවරේ ය, නානත්ව කවරේ යැ? යි මෙසේ විචාරන්නාහු නම් මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්‍යතොටු පිරිවැජියනට කිමැ යි ප්‍රකාශ කරන්නහු ද?

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නෙතා කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. වහන්ස, තෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේ නම් මනා මැ නු. භාග්‍යවතුන් වහන්සේගේ තෙපුල් අසා භික්ෂූහු ධරන්නාහ.

මහණෙනි, එසේ වී නම් අසව ... භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

මහණෙනි, ඉදින් අන්‍යතොටු පිරිවැජියෝ "ඇවැත්නි, මේ ධර්මයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: රාගය ද්වෙෂය මොහ යි. ඇවැත්නි, මේ ධර්මයෝ තුන් දෙනයහ. ඇවැත්නි, මේ ධර්මයන් තුන් දෙනාගේ විශෙෂය කවරේ යැ, අභිප්‍රාය කවරේ යැ, නානත්ව කවරේ යැ?" යි මෙසේ විචාරන්නාහු නම්, මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්‍යතොටු පිරිවැජියනට මෙසේ ප්‍රකාශ කරව: ඇවැත්නි, රාගය අල්පසාවද්‍ය ය, ලැසිව පහවන සුලු ය. ද්වෙෂය මහාසාවද්‍ය ය, වහා පහවන සුලු ය. මොහය මහා-සාවද්‍ය ය, ලැසිව පහවන සුලුය යි.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ රාගය උපදනේ ද, උපන් හෝ රාගය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ වේ ද, එයට හේතු කවරේ යැ, ප්‍රත්‍යය කවරේ යැ? එයට හේතු සුභනිමිත්තය යි කිය යුතු ය.

සුභනිමිත්ත නුනුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද රාගය උපදනේ ය. උපන්නා වූ ද රාගය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ රාගය උපදනේ ද, උපන් හෝ රාගය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ද, මේ එයට හෙතු වේ. මේ එයට ප්‍රත්‍යය වෙයි.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ ද්වෙෂය උපදනේ ද, උපන් හෝ ද්වෙෂය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ද, එයට හේතු කවරේ යැ, එයට ප්‍රත්‍යය කවරේ යැ? එයට හේතු ප්‍රතිඝනිමිත්තය යි කිය යුතු ය.

ප්‍රතිඝනිමිත්ත නුනුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද ද්වෙෂය උපදනේ ය. උපන්නා වූ ද ද්වෙෂය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ ද්වෙෂය උපදනේ ද, උපන් හෝ ද්වෙෂය භූයෝභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ද මේ එයට හේතු වෙයි. මේ එයට ප්‍රත්‍යය වෙයි

කො පනාවුසො හෙතු, කො පච්චයො, යෙන අනුප්පන්නො වා මොහො උප්පජ්ජති, උප්පන්නො වා මොහො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති? අයොනිසො මනසිකාරොතිස්ස වචනීයං.

තස්ස අයොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව මොහො උප්පජ්ජති, උප්පන්නො ච මොහො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අයං ඛො ආවුසො හෙතු අයං පච්චයො, යෙන අනුප්පන්නො වා මොහො උප්පජ්ජති, උප්පන්නො වා මොහො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

කො පනාවුසො හෙතු, කො පච්චයො, යෙන අනුප්පන්නො වා රාගො නුප්පජ්ජති, උප්පන්නො වා රාගො පහීය්‍යතීති? අසුභනිමිත්තන්තිස්ස වචනීයං.

තස්ස අසුභනිමිත්තං යොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව රාගො නුප්පජ්ජති, උප්පන්නො ච රාගො පහීය්‍යති. අයං ඛො ආවුසො හෙතු අයං පච්චයො. යෙන අනුප්පන්නො වා[1] රාගො නුප්පජ්ජති, උප්පන්නො වා රාගො පහීය්‍යතීති.

කො පනාවුසො හෙතු, කො පච්චයො, යෙන අනුප්පන්නො වා දොසො නුප්පජ්ජති, උප්පන්නො වා දොසො පහීය්‍යතීති? මෙත්තා චෙතොවිමුත්තීතිස්ස වචනීයං.

තස්ස මෙත්තං චෙතොවිමුත්තිං යොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව දොසො නුප්පජ්ජති, උප්පන්නො ච[2] දොසො පහීය්‍යති. අයං ඛො ආවුසො හෙතු අයං පච්චයො. යෙන අනුප්පන්නො වා[1] දොසො නුප්පජ්ජති. උප්පන්නො වා[2] දොසො පහීය්‍යතීති.

කො පනාවුසො හෙතු, කො පච්චයො, යෙන අනුප්පන්නො වා මොහො නුප්පජ්ජති, උප්පන්නො වා[2] මොහො පහීය්‍යතීති. යොනිසො මනසිකාරොතිස්ස වචනීයං.

තස්ස යොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව මොහො නුප්පජ්ජති, උප්පන්නො ච මොහො පහීය්‍යති. අයං ඛො ආවුසො හෙතු, අයං පච්චයො. යෙන අනුප්පන්නො වා මොහො නුප්පජ්ජති, උප්පන්නො වා මොහො පහීය්‍යතීති.

### 3. 2. 2. 9.

19. තීණිමානි භික්ඛවෙ අකුසලමූලානි. කතමානි තීණි: ලොභො අකුසලමූලං දොසො අකුසලමූලං මොහො අකුසලමූලං.

යදපි භික්ඛවෙ ලොභො, තදපි අකුසලං[3]. යදපි ලුද්ධො අභිසඞ්ඛරොති. කායෙන වාචා[4] මනසා. තදපි අකුසලං. යදපි ලුද්ධො ලොභෙන අභිභූතො පරියාදින්නචිත්තො පරස්ස අසතා දුක්ඛං උපදහති[5], වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා. "බලවම්හි බලත්ථො ඉතිපි"[6] තදපි අකුසලං. ඉතිස්සමෙ ලොභජා ලොභනිදානා ලොභසමුදයා ලොභපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.

---

1. අනුප්පන්නො චෙව - මජ්සං. 2 උප්පන්නො ච - මජ්සං. 3. අකුසලමූලං - මජ්සං.
4 වාචාය - මජ්සං. සී 1. 5. උප්පාදයති - මජ්සං. 6. බලත්ථො ඉති - සී 1. සිමු.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ මෝහය උපදනේ ද, උපන් හෝ මෝහය භූයෝභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ද, එයට හේතු කවරේ යැ, එයට ප්‍රත්‍යය කවරේ යැ? එයට හේතු නුනුවණින් මෙනෙහි කිරීමය යි කිය යුතු ය.

නුනුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද මොහය උපදනේ ය. උපන්නා වූ ද මෝහය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ මොහය උපදනේ ද, උපන් හෝ මොහය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ වේ ද, මේ එයට හෙතු වෙයි. මේ එයට ප්‍රත්‍යය වෙයි.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ රාගය නූපදනේ ද, උපන් හෝ රාගය පහව යන්නේ ද, එයට හෙතු කවරේ යැ, එයට ප්‍රත්‍යය කවරේ යැ? එයට හෙතු අශුභනිමිත්තය යි කිය යුතු වෙයි.

අශුභනිමිත්ත නුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද රාගය නූපදනේ ය. උපන්නා වූ ද රාගය පහව යන්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ රාගය නූපදනේ ද, උපන් හෝ රාගය පහව යන්නේ වේ ද, මේ එයට හෙතු වේ. මේ එයට ප්‍රත්‍යය වේ.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් ද්වෙෂය නූපදනේ ද, උපන් හෝ ද්වෙෂය පහව යන්නේ වේ ද, එයට හෙතු කවරේ යැ, එයට ප්‍රත්‍යය කවරේ යැ? එයට හෙතු මෛත්‍රාචෙතොවිමුක්තිය යි කිය යුතු වෙයි.

මෛත්‍රීචෙතොවිමුක්තිය නුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද ද්වේෂය නූපදනේ ය. උපන්නා වූ ද ද්වේෂය පහව යන්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන්නා වූ ද ද්වේෂය නූපදනේ වේ ද, උපන්නා වූ හෝ ද්වේෂය පහව යන්නේ වේ ද, මේ එයට හෙතු වේ. මේ එයට ප්‍රත්‍යය වේ.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ මෝහය නූපදනේ ද, උපන් හෝ මෝහය පහව යන්නේ වේ ද, එයට හේතු කවරේ යැ? එයට ප්‍රත්‍යය කවරේ යැ? එයට හෙතු නුවණින් මෙනෙහි කිරීමය යි කිය යුතු වෙයි.

නුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද මොහය නූපදනේ වෙයි. උපන්නා වූ ද මෝහය පහව යන්නේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ මෝහය නූපදනේ ද, උපන් හෝ මෝහය පහව යන්නේ වේ ද, මේ එයට හේතු වෙයි. මේ එයට ප්‍රත්‍යය වෙයි.

## 3. 2. 2. 9

19. මහණෙනි, මේ අකුශලමූලයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: ලෝභය අකුශලමූලයෙකි. ද්වේෂය අකුශලමූලයෙකි. මෝහය අකුශලමූලයෙකි.

මහණෙනි, යම් ලෝභයෙක් වේ ද, හෙ ද අකුශලය. ලුබ්ධ වූයේ කයින් වේවයි වචයින් වේවයි මනයින් වේවයි යමක් පිළියෙළ කරන්නේ නම් එ ද අකුශලය. ලුබ්ධ වූයේ ලෝභයෙන් මඩනා ලද්දේ ලෝභයෙන් ගත් සිතැත්තේ "බලවත් වෙමි. බලයෙන් අර්‍ථ ඇතියෙමි" යි හෝ මෙරමාහට වධයෙන් වේවයි බන්ධනයෙන් වේවයි, සර්‍වස්වහරණයෙන් වේවයි, ගර්‍හායෙන් වේවයි, ගැමින් හෝ රටින් නෑගීමෙන් වේවයි, අවිද්‍යමානදෙෂයෙකින් දුක් උපදවා ද, එ ද අකුශලය. මෙසේ ලෝභයෙන් හටගත් ලෝභය නිදාන කොට ඇති ලෝභය සමුදය කොට ඇති ලෝභය ප්‍රත්‍යය කොට ඇති අනේකපාපක අකුශලධර්‍මයෝ ඔහට පහළ වෙත්.